# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2170/8 - 2020 අප්‍රේල් මස 11 වැනි සෙනසුරාදා - 2020.04.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 40/1973(I)

**(222 වන අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනත**

(222 වන අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ 2 වන සහ 3 වන වගන්ති යටතේ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**පවිත්‍රා වන්නිආරච්චි,**
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 11 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

කලින් කල සංශෝධිත 1925 අගෝස්තු මස 28 වන දින, අංක 7481 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ධාන්‍ය ගබඩා කිරීම සම්බන්ධයෙන් වන නිරෝධායන නියෝග හා ඇන්කිලොස්ටොමියාසිස් සම්බන්ධයෙන් වන නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 46 වන නියෝගයේ, "ඉහතින්ම වූ රීතියේ සඳහන් ඕනෑම රෝගයක් බලපා ඇති" යන වචන වෙනුවට "ඕනෑම රෝගයක් බලපා ඇති" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි 47 වන නියෝගයේ, "45 වන රීතියේ සඳහන් ඕනෑම රෝගවලින් යම් රෝගයක් ඇතිවන යම් අවස්ථාවක දී" යන වචන වෙනුවට "ඕනෑම රෝගයක් ඇතිවන අවස්ථාවක දී" යන වචන ආදේශ කිරීමෙන්;



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(3) එහි 48 වන නියෝගයේ, "45 වන රීතියේ සඳහන් රෝගවලින් යම් රෝගයක්" යන වචන වෙනුවට "ඕනෑම රෝගයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(4) එහි 61 වන නියෝගයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන්:-

"61අ. 2019 කොරෝනා වෛරස් රෝගයෙන් (කොවිඩ්–19) මිය ගොස් ඇති තැනැත්තකුගේ මෘත දේහය ආදාහනය කිරීම -

(1) 61 වන සහ 62 වන නියෝගවල සඳහන් විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 2019 කොරෝනා වෛරස් රෝගයෙන් (කොවිඩ්–19) මිය ගොස් ඇති හෝ මිය ගොස් ඇති බවට සැක කරනු ලබන යම් තැනැත්තකුගේ මෘත දේහය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුකූලව -

(අ) යම් විභව්‍ය ජෛව විද්‍යාත්මක උවදුරක් වැළැක්වීමේ කාර්යය සඳහා සෙල්සියස් අංශක 800 සිට 1200 දක්වා වූ උෂ්ණත්වයක් සහිතව විනාඩි හතලිස් පහක සිට පැයක කාලයක් සඳහා සම්පූර්ණයෙන් දැවී යන තෙක් ;

සහ

(ආ) නිසි බලධරයා විසින් අනුමත කරන ලද සුසාන භූමියක හෝ ස්ථානයක ඒ බලධරයාගේ අධීක්ෂණය යටතේ,

ආදාහනය කරනු ලැබිය යුතු ය.

(2) කවර හෝ තැනැත්තකු විසින්, 2019 කොරෝනා වෛරස් රෝගයෙන් (කොවිඩ්–19) මිය ගොස් ඇති හෝ මිය ගොස් ඇති බවට සැක කරනු ලබන යම් තැනැත්තකුගේ මෘත දේහය නිසි බලධරයා විසින් නම් කරන ලද, අවශ්‍ය ආදාහන කටයුතු භාරගෙන සිටින යම් තැනැත්තන් හැර, කිසිම තැනැත්තකු වෙත භාරදෙනු නොලැබිය යුතු ය.

(3) ඒ සුසාන භූමියේ හෝ ස්ථානයේ දී මෘත දේහය හසුරුවනු ලබන තැනැත්තන්ගේ ඇඳුම සහ නැවත භාවිත කළ නොහැකි පෞද්ගලික ආරක්ෂණ උපාංග, ආදාහන අවස්ථාවේ දී මිනී පෙට්ටිය ද සමඟින් පුළුස්සා දමනු ලැබිය යුතු ය.

(4) නැවත භාවිත කළ හැකි උපාංග සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද විධානවලට අනුකූලව නිසි පරිදි පිරිසිදු කර විෂබීජහරණය කරනු ලැබිය යුතු ය.

(5) මෘත දේහයේ භෂ්මාවශේෂ ඒ මිය ගිය තැනැත්තාගේ ළඟම ඥාතියාගේ ඉල්ලීම පරිදි ඒ ළඟම ඥාතියා වෙත භාරදෙනු ලැබිය හැකි ය.".

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.